# දැන්වීමයි

## සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත

**ප්‍රධාන විනය පාලක තනතුර සහ උප විනය පාලක තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ශිෂ්‍ය විනය සම්බන්ධව අනුමත අතුරු ව්‍යවස්ථාව 01/2026 සහ 2026.02.27 හා 2026.02.02 දිනැති ව පළ කරන ලද දැන්වීම් හා බැඳේ.

2026.03.16 වන දින පැවති 227 වන පාලක සභා රැස්වීමේදී ප්‍රධාන විනය පාලක හා උප විනය පාලක තනතුරු බඳවා ගැනීම සඳහා සලකා බැලෙන මූලික සුදුසුකම් පහත පරිදි සංශෝධනය කිරීමට තීරණය කර ඇත.

<u>මූලික සුදුසුකම්</u>

**ප්‍රධාන විනය පාලක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වන ශ්‍රේණිය හෝ ඉහළ ශ්‍රේණියක ආචාර්යවරයෙකු වීම.**

**උප විනය පාලක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වන ශ්‍රේණිය හෝ ඉහළ ශ්‍රේණියක ආචාර්යවරයෙකු වීම.**

<u>තෝරාගැනීමේදී පහත සුදුසුකම් සැලකිල්ලට ගනු ලැබේ.</u>

1. ප්‍රධාන විනය පාලක තනතුර සඳහා පීඨාධිපති/ අධ්‍යයනාංශ ප්‍රධාන තනතුරක සේවා පළපුරුද්ද ද උප විනය පාලක තනතුර සඳහා අධ්‍යයනාංශ ප්‍රධාන තනතුරක සේවා පළපුරුද්ද
2. විශ්වවිද්‍යාලයේ වෙනත් පරිපාලන තනතුරුවල සේවා පළපුරුද්ද
3. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක/ ශිෂ්‍ය උපදේශක තනතුරක සේවා පළපුරුද්ද
4. නේවාසිකාගාර පාලක/ නේවාසිකාගාර උප පාලක (අධ්‍යයන) තනතුරක පළපුරුද්ද

මේ අනුව ප්‍රධාන විනය පාලක සහ උප විනය පාලක තනතුරු සඳහා අයදුම්පත් ස්වකීය සවිස්තරාත්මක ජීවදත්ත පත්‍රිකාවක් සහිතව 2026.03.31 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු අංශය වෙත ගෙනැවිත් භාර දීමට කටයුතු කරන්න.

මහාචාර්ය රොහාන් නෙත්සිංහ

උපකුලපති

2026.03.20

මහාචාර්ය රොහාන් නෙත්සිංහ
උපකුලපති
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07.
ශ්‍රී ලංකාව.